00543

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී ගෞරව

උපාධි වැඩසටහන- 4වන මට්ටම

අවසාන පරීක්ෂණය 2023/2024

**EPU4531- ඉගෙනුම් ඉගැන්වීම් පර්යාලෝක**

කාලය - පැය තුනයි. (03)

දිනය - 2025.06.20 වේලාව - පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

---

1 වන කොටසේ ඇති සියලුම ප්‍රශ්නවලටද, 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.

<u>1 - වන කොටස</u>

01. 1997 හඳුන්වා දුන් "නිපුණතා පාදක විෂය මාලාව" යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.

02. ප්‍රාථමික ළමුන් සඳහා ප්‍රවේශ නිපුණතා වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ අරමුණු දෙකක් (02) කෙටියෙන් පැහැදිලි කරන්න.

03. 1997 හඳුන්වා දුන් ප්‍රාථමික අධ්‍යාපන ප්‍රතිසංස්කරණ කෙරෙහි මහත්මා ගාන්ධිගේ දාර්ශනික අදහස්වල බලපෑම විස්තර කරන්න.

04. ඵලදායී ඉගෙනුම් පරිසරයක් පවත්වා ගැනීම සඳහා Buckler & Castle (2014) විසින් හඳුනවා දුන් ප්‍රමිතීන් පහක් (05) සඳහන් කරන්න.

05. Uri Bronfenbrenner ගේ සාර්ව පද්ධතියේ (Macro System) අංග, ගුරුවරුන් පන්ති කාමරයට යොදා ගන්නේ කෙසේද යන්න පැහැදිලි කරන්න.

06. ඉගෙනුම්- ඉගැන්වීම් ක්‍රියාවලියේදී ඉගැන්වීම් ආධාරක වැදගත් වීමට හේතු පහක් (05) දක්වන්න.

07. තක්සේරුව සහ ඇගයීම අතර ඇති වෙනස්කම් මොනවාද?

08. ඩේල්ගේ අත්දැකීම් කේතුව අඳින්න.

ලකුණු 05 X 08 =40



87

00543

<u>02 - වන කොටස</u>

09. I. Pestalozzi ගේ අධ්‍යාපනික ප්‍රවේශයේ එක් ප්‍රධාන මූලධර්මයක් වූයේ: "අධිකාරිය පදනම් විය යුත්තේ ආදරය මත මිස බිය මත නොවේ- එනම්, ගුරුවරුන් සිසුන්ට මගපෙන්විය යුත්තේ සහ හසුරුවාගත යුත්තේ දඬුවම් හෝ බිය ගැන්වීම් තුළින් නොව, සැලකිල්ල, ගෞරවය සහ අවබෝධය තුළින්ය". ඔබ මෙම ප්‍රකාශය සමඟ එකඟද? ඔබේ පිළිතුර සනාථ කිරීමට හේතු සපයන්න. (ලකුණු 10)

II. වර්තමාන ප්‍රාථමික පන්තිකාමර තුළ මෙම මූලධර්මය කෙතරම් දුරට පිළිබිඹු වන්නේද යන්න විශ්ලේෂණය කරන්න. (ලකුණු 10)

10. I. සම්පිණ්ඩික තක්සේරුව සහ සම්භවන තක්සේරුව යන පද සුදුසු උදාහරණ සමඟ සංසන්දනය කරන්න. (ලකුණු 04 )

II. තක්සේරුව සඳහා ඵලදායී ප්‍රශ්නකරනයේදී ගුරුවරුන් විසින් අනුගමනය කළ යුතු ශිල්පීය ක්‍රම හතරක් (04) සාකච්ඡා කරන්න. (ලකුණු 06 )

III. ශිෂ්‍යයාගේ ප්‍රගතිය තක්සේරු කිරීමේදී ගුරුවරුන් මුහුණ දෙන ගැටළු / අභියෝග දෙකක් (02) සඳහන් කර ඒවා ජය ගැනීමට හෝ අවම කිරීමට යෝජනා ඉදිරිපත් කරන්න. (ලකුණු 10 )

11. I. "අධ්‍යාපනයේ පළමු පියවර වන්නේ ළමුන් තමා විසින්ම කළ දේවල් වලින් ලැබූ අත්දැකීම් වල ප්‍රීතිය අත්විඳීමට ඉඩ දීමයි." ඉහත ප්‍රකාශය මොන්ටිසෝරි ප්‍රවේශය සම්බන්ධ කර ළමුන් තුළ ස්වයං විශ්වාසය සංවර්ධනය කළ යුතු ආකාරය සාකච්ඡා කරන්න. (ලකුණු 10 )

II. ශිෂ්‍ය හිතකාමී ඉගෙනුම් පරිසරයක් සකස් කිරීමේදී ගුරුවරයාගේ කාර්යභාරය අගයන්න. (ලකුණු 10 )

12. I. "ඉගැන්වීම් ආධාරක නිර්මාණය කිරීමේදී හෝ තෝරා ගැනීමේදී ඒවායේ ඵලදායී ලක්ෂණ පිළිබඳව ගුරුවරුන් දැනුවත් වීම වැදගත් බව Aggarwal and Gupta (2007) අවධාරණය කරයි."
ඉගෙනුම් ආධාරක තෝරාගැනීමේදී සහ සකස් කිරීමේදී වැදගත් වන කරුණු පහක් (05) පැහැදිලි කරන්න. (ලකුණු 10 )

II. "නිශ්ක්‍රිය ඉගෙනුමට වඩා කිරීමෙන් ලබන ඉගෙනුම වඩා හොඳ ධාරණයට මඟ පාදයි." ඩේල්ගේ අත්දැකීම් කේතුව භාවිතයෙන් මෙම ප්‍රකාශය සාධාරණීකරණය කර ප්‍රාථමික ශ්‍රේණියට අදාළ තේමාවක් සඳහා ඉගැන්වීම් ආධාරක සඳහා උදාහරණ සපයන්න. (ලකුණු 10)

13. I. විගොට්ස්කිගේ සමාජ සංස්කෘතික ඉගෙනුම් න්‍යායේ ප්‍රධාන ලක්ෂණ විස්තර කරන්න. (ලකුණු 10 )

II. සහායක ප්‍රාථමික පන්තිකාමර පරිසරයක් නිර්මාණය කිරීම සඳහා මෙම න්‍යාය යෙදිය හැක්කේ කෙසේද? උදාහරණ සම්බන්ධ කරමින් පැහැදිලි කරන්න. (ලකුණු 10)

*-සියලුම හිමිකම් ඇවිරිණි.-*